**දකුණු පළාත් සභාව**
**රුහුණු සංචාරක කාර්යාංශය**
**තනතුරු පුරප්පාඩු**

රුහුණු සංචාරක කාර්යාංශයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනමින් මාස 06 ක කාල සීමාවක් සඳහා (සටුතුදායක සේවය මත සේවා දීර්ඝ කිරීම් හිමි වේ.) බඳවා ගැනීමට 2026. 02. 27 දින ප.ව.4.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **<u>ව්‍යාපෘති සහකාර (MA 1 – 1) (තනතුරු 02)</u>**

**<u>සුදුසුකම්</u>**

<u>බාහිර අයදුම්කරුවන්</u>

<u>අධ්‍යාපන</u>

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

1. සිංහල/දෙමළ
2. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03) ක් සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

(ඇ) ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ ඇති හැකියාව අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණය පහත ‘ආ’, ‘ඇ’ සහ ‘ඉ’ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ,

1. සිංහල/දෙමළ
2. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථයන් සමඟ එකවර විෂයයන් 06කින් සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිලිබඳ තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවයන් අදාළ අවස්ථාවන් හිදී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

(ඇ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු පහක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස :-**

අවු: 22 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් :-**

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

1. පූර්වාසන්න වසර 03 ක කාලය තුළ දකුණු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**වැටුප් පරිමාණය :-**

රු. 46,220 – 10x540 – 7x630 – 4x890 – 20x1190 - රු. 83,390/=

**කොන්ත්‍රාත් කාල සීමාව :-**

මාස 06 ක කාලයක් සඳහා (සටුතුදායක සේවය මත සේවා දීර්ඝ කිරීම් හිමි වේ.)

**බඳවා ගැනීමේ ක්‍රමය :-**

ආයතනයෙහි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි පුවත්පත් දැන්වීමකින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින් ඉල්ලුම්පත් කැඳවා පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**සම්මුඛ පරීක්ෂණය**

බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | ලකුණු 30 |
| අනෙකුත් කුසලතා/ කාර්ය සාධනය | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | 100 |

සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

**සුදුසුකම් ලබන දිනය :-**

සේවයට / තනතුරට පත් කිරීම සඳහා වන බඳවා ගැනීමේ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු විසින් සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

<u>අයදුම්පත් ක්‍රියාපටිපාටිය</u> **:-**

1. පුරප්පාඩු තනතුරු සම්බන්ධයෙන් සියලුම තොරතුරු රුහුණු සංචාරක කාර්යාංශයේ වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබා ගත හැකි අතර අදාළ අයදුම්පත් එම වෙබ් අඩවියෙන් බාගත කර ගත යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත **සභාපති, රුහුණු සංචාරක කාර්යාංශය, 153බී, එස්.එච්.දහනායක මාවත, ගාල්ල** යන ලිපිනයට **2026.02.27** දින **ප.ව.4.00** ට පෙර ලියාපදිංචි තැපැලෙන් යොමු කර රුහුණු සංචාරක කාර්යාංශය වෙත ලැබිය යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු වේ.

2. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් නොකිරීම හා අදාළ සහතිකවල ජායා පිටපත් අමුණා නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

3. කිසියම් හේතුවක් මත යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප වුවහොත් එම අයදුම්පත නැවත සලකා බලනු නොලැබේ.

**සභාපති,**
**රුහුණු සංචාරක කාර්යාංශය,**
**අංක 153 බී,**
**එස්.එච්. දහනායක මාවත,**
**ගාල්ල.**
**2026.02.13**